නිවේදනය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනසත්ව නියාමක II ශ්‍රේණියේ නිලධාරීන්

වනසත්ව අඩවි සහකාර II ශ්‍රේණියට පත් කිරීම

මෙම දෙපාර්තමේන්තුවේ වනසත්ව අඩවි සහකාර තනතුරේ පවතින පුරප්පාඩු 153 ක් පිරවීම සඳහා 2026.11.11 දිනට සුදුසුකම් ලත් නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2026.12.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ඔබට අදාල සහකාර අධ්‍යක්ෂ / පශු වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය සමඟ ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතුය.

03. සුදුසුකම් :-

මෙම දෙපාර්තමේන්තුවේ වනසත්ව නියාමක තනතුරේ II ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධාරියෙක් වීම.

04. තෝරාගනු ලබන ආකාරය :-

මෙම දෙපාර්තමේන්තුවේ වනසත්ව නියාමක II ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව වනසත්ව අඩවි සහකාර තනතුරට පත් කරනු ලැබේ.

05. සියලුම වනසත්ව නියාමක II ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් යොමු කළ හැකි බැවින්, එසේ ඉල්ලුම්පත් යොමු නොකරන නිලධාරීන් වනසත්ව අඩවි සහකාර II ශ්‍රේණියට පත්වීම සඳහා කැමැත්ත පල නොකරන නිලධාරීන් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

06. නියමිත දිනට පසුව එවන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. වනසත්ව අඩවි සහකාර තනතුරට තෝරා ගැනීමෙන් පසුව අදාළ තනතුර සඳහා සාවද්‍ය කරුණු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඒ සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කරනු ඇත.

08. මෙම නිවේදනයේ සඳහන් කර නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධරයාගේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ද පත්වීම් බලධරයා සතුය.

එම.එස්.එල්.ආර්.පී. මාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

වනසත්ව අඩවි සහකාර II ශ්‍රේණියට පත් කිරීම

01. නම:- .....

02. ජාතික හැඳුනුම්පත් අංකය :- ..... 03. උපන්දිනය :- .....

04. වර්තමාන සේවා ස්ථානය :- .....

05. දුරකථන අංකය :- .....

06. වනසත්ව අඩවි සහකාර II තනතුරට උසස්වීම සඳහා කැමැත්ත පළ කරන්නේ ද ? ඔව් / නැත
පිළිතුර "ඔව්" නම්,

07. වනසත්ව නියාමක II ශ්‍රේණියට උසස් කළ දිනය :- .....

08. සේවා කාලය - ස්ථිර කම්කරු :- .....
වනසත්ව නියාමක :- .....

09. ලබා ඇති පුහුණුවීම් පිළිබඳ විස්තර :-

.....

.....

.....

10. ලබා ඇති ප්‍රශංසා / දෝෂ දර්ශන / විනය නියෝග පිළිබඳ විස්තර :-

.....

.....

11. අයදුම්කරුගේ ප්‍රකාශය :-

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද සියළුම තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

අයදුම්කරුගේ අත්සන :- ..... දිනය :- .....

12. නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ / පශු වෛද්‍ය නිලධාරීගේ නිර්දේශය :- .....

අත්සන :- .....

දිනය :- .....

නිල මුද්‍රාව :- .....

වනසත්ව නියාමක III ශ්‍රේණියේ පත්වීම භාරගත් දිනය :- .....
වනසත්ව නියාමක II ශ්‍රේණියේ උසස්වීම භාරගත් දිනය :- .....
ඉහත සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව තහවුරු කරමි.

.....
පෞද්ගලික ලිපි ගොනුව භාර නිලධාරියාගේ අත්සන
(ප්‍රධාන කාර්යාලය)